## 1994 සිට 2015 දක්වා ඒ ඒ ජනාධිපතිවරණ කාලසීමාවන් තුළ ගුරුදා විග්‍රහයේ හැසිරීම පිළිබඳ විශ්ලේෂණයක්


සුභාෂිණී ගුණරත්න
සමාජීය විද්‍යාපති (MSSc) - 2018
FGS/MACO/MACO/13/014
ජනසන්නිවේදන අධ්‍යයන් අංශය, කැළණිය විශ්වවිද්‍යාලය


### සාරාංශය


ස්වකීය මතයක්, දෘෂ්ටියක් නොමැති හා න්‍යායික සංකල්ප පිළිබඳ පුළුල් දැනුමක් නොමැති පොදු මහ  ජනතාව වෙත තොරතුරු රැගෙන යමින් මත නිර්මාණය කිරීමේ කාර්යයේ දී පුවත්පතක දේශපාලන විශ්ලේෂණයන්හි භූමිකාව අතිශය වැදගත් වේග පුද්ගල ප්‍රතිරූප ඔසවා තබමින් සහ බිඳ හෙළමින් විශ්ලේෂකයින් නිර්මාණය කරන දේශපාලන චරිත පොදු ජනතාවගේ ඉදිරි වසර ගණනාවක ඉරණම තීරණය කරන බැවින් දේශපාලන විශ්ලේෂකයකුගේ මධ්‍යස්ථභාවය තීරණාත්මකය. ජනාධිපතිරණය වැනි සුවිශේෂී දේශපාලන වාතාවරණයක ස්වීය මත එළැඹුම් පිළිබඳ ස්වයං වගවීමක් සතු විශ්ලේෂකයාගේ දේශපාලනමය හැසිරීමත් ලාංකීය දේශපාලන විශ්ලේෂකයා විශ්ලේෂණයන් සිදු කරනු ලබන ආකෘතිමය ස්වභාවය සහ පුද්ගලික ආරෝපණයන් විශ්ලේෂණ කාර්යය සඳහා කරන බලපෑම අධ්‍යයනය කිරීම මූලික අරමුණු කරගනිමින් පර්යේෂණය සිදු කෙරිණි.

ලෝකයේ බලගතුම රාජ්‍ය නායකයා ලෙස සැලකෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලාංකික පුවත්පතෙහි විශ්ලේෂකයාග් භූමිකාව පිළිබඳ කරනු ලබන අධ්‍යයනය සඳහා මෙරට පුවත්පතෙහි ප්‍රකට මෙන්ම විවේචනාවන්ට බඳුන්වෙමින් 1993 සිට අඛණ්ඩව මේ දක්වා දීර්ඝ කාලයක් රචනා වන දේශපාලන විශ්ලේෂණය ලෙස උපුල් ජෝෂප් ප්‍රනාන්දු විසින් ලංකාදීප පුවත්පත සහ මව්බිම පුවත්පත වෙත රචනා කරනු ලැබූ ගුරුදා විග්‍රහය හඳුනා ගැණුනු අතර 1994 සිට 2015 දක්වා මෙරට පැවති ජනාධිපතිවරණ පහකදී එය මත එළැඹුම් වෙත ප්‍රවිශ්ඨ වී ඇති ආකාරය පර්යේෂණයට ලක් කෙරිණි. ජනාධිපතිවරණ කාලසීමාවන්ට අදාළව පූර්ව දේශපාලන උපකල්පන වෙත එළැඹීමේ දී ගුරුදා විග්‍රහය පක්ෂග්‍රාහී වී තිබේ ද යන පර්යේෂණ ගැටලුව ගොඩනඟමින් පර්යේෂණය සිදු කරන ලදී. ජනාධිපතිවරණ කාලසීමාවන්ට අදාළව පූර්ව දේශපාලන උපකල්පන වෙත එළැඹීමේ දී ගුරුදා විග්‍රහය පක්ෂග්‍රාහී වී ඇත යන්න පර්යේෂණ ගැටලුව ඔස්සේ ගොඩනැගූ උපන්‍යාසය වේග එකී උපන්‍යාසය සත්‍යෙක්ෂණය සඳහා අන්තර්ගත විශ්ලේෂණය ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කෙරිණි.

ජනාධිපතිවරණ කාල සීමාවන්හි දී ගුරුදා විග්‍රහයේ පඨිතයන් සියුම් ලෙස අධ්‍යයනය කිරීමේ දී දේශපාලනය විශ්ලේෂණය කරනු ලබන සම්මත ආකෘති, න්‍යායයන් සහ සංකල්ප අනුව ගුරුදා විග්‍රහයෙහි ආකෘතිමය ස්වරූපය නිරීකෂණය කරන ලදී. ගුරුදා විග්‍රහය විශ්ලේෂණාත්මක කාර්යයේ දී අවිධිමත් ආකෘතිය මත පිහිටා දේශපාලන උපකල්පන (Assumption) වෙත එළැඹන දේශපාලන විශ්ලේෂණ ප්‍රවර්ගය යටතට අයත් බව හදුනා ගැණුනු අතර නියැදිගත කාලසීමාවේ දී එමඟින් එළැඹුණු සියලු උපකල්පන සන්දර්භ කිහිපයක් ඔස්සේ වර්ගීකරණය කරමින් ගුරුදා විග්‍රහය ගොඩනඟනු ලැබූ දේශපාලන උපකල්පනයන්හි ස්වරූපය අධ්‍යයනය කරන ලදී. එමෙන්ම ගුරුදා විග්‍රහය දේශපාලන මත ඉදිරිපත් කිරීමේ දී කිසියම් සාධකයක් වෙත නැඹුරු වෙමින් පක්ෂග්‍රාහී එළැඹුම් ලබා ගැනීම සදහා තත්කාලීන දේශපාලන සංසිද්ධීන් භාවිත කර ඇති ආකාරය අධ්‍යයනය කරනු ලැබිණි. එකම දේශපාලන තත්ත්වය පිළිබද පැවති විවිධ දෘෂ්ටිකෝණයන් හඳුනාගැනීම සදහා සමකාලීන දේශපාලන විශ්ලේෂකයින් එළැඹුණු මත දැක්වීම් අතර ගුරුදා විග්‍රහයෙන් විශ්ලේෂණය කරන දේශපාලන තත්ත්වයන්ට මෙන්ම එළැඹුණු මතවාදීමය ප්‍රවේශයන්ට සමාන සහ ප්‍රතිපක්ෂ අවස්ථා නිරීක්ෂණය කරන ලදී. අන්තර්ගත විශ්ලේෂණය සහ සම්මුඛ සාකච්චා  ක්‍රමවේදය  ඔස්සේ  එකී  දත්ත  විශ්ලේෂණය  සිදු විය. ඒ අනුව මෙරට ජනාධිපතිවරණ 5කදී ගුරුදා විග්‍රහය සිදු කළ මතවාදී ප්‍රවේශය සියුම්ව අන්තර්ගත විශ්ලේෂණය කරමින් සිදු කළ අධ්‍යයනයේදී එහි සන්දර්භීය ආකෘතිය එකී සෑම ජනාධිපතිවරණයකදීම කිසියම් අපේක්ෂක්යකුගේ දේශපාලන ප්‍රතිරූපය ඉහළ නංවමින් ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ ප්‍රතිරූපය පහළ දමින් පක්ෂග්‍රාහී ලෙස මතවාදී ප්‍රවේශයන් වෙත එළැඹී ඇති බව නිරීක්ෂණය කළ අතර මෙය ඒ සඳහා පුවත්පත් හිමිකාරීත්වයෙන් දේශපාලන අධිකාරියෙන් සහ ආත්මීය ආරෝපණයන්ගෙන් සිදු වූ බලපෑම ද විමර්ශනය කරමින් සිදු කළ පර්යේෂණාත්මක අධ්‍යයනයක් වේ.

**ප්‍රමුඛ පද: දේශපාලනය, විශ්ලේෂණය, ජනාධිපතිවරණ, ගුරුදා විග්‍රහය, උපකල්පන**